වීමක් දක්නට ලැබේ. මා විසින් මෙම නිබන්ධනයේ දී සාකච්ඡා කරනු ලබන්නේ අද්‍යතන ලාංකේය සිනමාවේ භාවිත ආඛ්‍යාන ක්‍රමවේදයන් පිළිබඳවයි.

ලාංකේය සිනමාව පිළිබඳව විමසීමේදී මුල් අවධියේ සිංහල චිත්‍රපට නිර්මාණයේදී භාවිතා කරන ලද්දේ සම්මත ආඛ්‍යාන විලාසයකි. මෙය ඉන්දීය චිත්‍රපට අනුකාරකයක් ද විය. මෙම ස්වරූපය මදක් හෝ වෙනස් කරන ලද්දේ 60 දශකයේදී බිහිවූ සිනමා කෘති හරහාය. රේඛාව, ගම්පෙරළිය, දහසක් සිතුවිලි, දෙලොවක් අතර මෙම සිනමා කෘති අතර ප්‍රමුඛවේ. ක්‍රම ක්‍රමයෙන් ඇති වූ ආර්ථික, දේශපාලනික, සංස්කෘතික, සමාජීය වෙනස් වීම් හා සංවර්ධනය වීම් හරහා 70, 80 දශකය වන විට ලාංකේය සිනමාව සම්මත ආඛ්‍යාන ශෛලියෙන් ඔබ්බට ගමන් කිරීමට සමත් විය. ඒ ධර්මසේන පතිරාජ, වසන්ත ඔබේසේකර, ධර්මසිරි බන්ඩාරණායක වැනි සිනමානිර්මාණ කරුවන්ගේ සිනමාකෘති හරහාය. පළඟැටියෝ, අහස් ගව්ව, පාරදිගේ, දඩයම වැනි සිනමා කෘති හරහා සම්මත මුල, මැද, අග ආඛ්‍යාන රීතිය බිඳ දැමීමට මොවුන් උත්සාහ දරා ඇති බව දැකිය හැකිය.

වර්තමානය වන විට ලෝක සිනමාවේ නව ප්‍රවණතාවන් මෙන්ම නව කලා සංකල්පයන්ගෙන්ද පෝෂණය වෙමින් නව සිනමාකරුවන් පිරිසක් සිනමා ක්ෂේත්‍රයට අවතීර්ණ වී ඇත. මොවුන් විසින් සිනමා භාෂාව නිවැරදිව හා ව්‍යක්තව පමණක් නොව සෞන්දර්යාත්මකව ද හසුරවමින් නව ආඛ්‍යාන ශෛලීන් පිළිබඳව පර්යේෂණ සිදුකරනු දක්නට ලැබේ.

අද්‍යතන ලාංකේය සිනමාවේ භාවිත ආඛ්‍යාන ක්‍රමවේදයන් පිළිබඳව මා අධ්‍යනය කරනුයේ 2000න් පසුව ලංකාව තුළ නිර්මණ වූ සිනමා නිර්මාණ පහක් යොදාගනිමිනි. එනම් සුළං කිරිල්ලී (ඉනෝකා සත්‍යාංගනී - 2003), මිල්ලෙ සොයා (බූඩී කීර්තිසේන - 2004), ඉරමැදියම (ප්‍රසන්න විතානගේ - 2005), සුළඟ එනු පිණිස (විමුක්ති ජයසුන්දර - 2006), අක්ෂරය (අශෝක හඳගම - 2006) යන චිත්‍රපටයන්ය. මෙම නිර්මාණයන් තෝරා ගන්නා ලද්දේ ඒවායේ අන්තර්ගතය හා ආකෘතිය තුළ ඇති සුවිශේෂී බව නිසාය.